# පොලිස් මාධ්‍ය කොට්ඨාසය

## பொலிஸ் ஊடகப் பிரிவு

## POLICE MEDIA DIVISION

14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.11.29 පැය 2100 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/ 2145 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**පොලිස් කොස්තාපල් තනතුර සඳහා බඳවා ගැනීමේ අවසන් සම්මුඛ පරීක්ෂණය තාවකාලිකව අවලංගු කිරීම සම්බන්ධව.**

රජයේ ගැසට් නිවේදන 2242 අනුව පොලිස් කොස්තාපල් තනතුර සඳහා බඳවා ගැනීමේ අවසන් සම්මුඛ පරික්ෂණය 2025.12.02, 03, 05 හා 09 යන දිනයන්හිදී පැවැත්වීමට නියමිතව තිබුණි.

දිවයින පුරා පවතින අයහපත් කාලගුණික තත්ත්වය මත විවිධ අපහසුතා හේතුවෙන් දිවයිනේ විවිධ ප්‍රදේශවල සිටින අවසන් සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීමට අපේක්ෂිත අයදුම්කරුවන්ට ඒ සඳහා පෙනී සිටීමට බාධා පවතින බවට නිරීක්ෂණය වී ඇත.

ඒ අනුව අවසන් සම්මුඛ පරීක්ෂණය තාවකාලිකව අවලංගු කරන බවට හා එම සම්මුඛ පරීක්ෂණය නැවත පැවැත්වෙන දිනයන් පිළිබඳව පසුව දැනුම් දීමට කටයුතු කරන බවට පොලිස් ආධුනිකයින් බඳවා ගැනීමේ කොට්ඨාසය මගින් දැනුම් දී ඇත.

එම අයදුම්කරුවන්ට පහත දුරකතන අංක මගින් වැඩිදුරටත් තොරතුරු ලබා ගත හැක.

**දුරකතන අංක -**

**011- 2552736**
**071- 8591925**

ඉහත නිවේදනය සම්බන්ධයෙන් ඔබ මාධ්‍ය මගින් ප්‍රචාරයක් ලබා දෙන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**